# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2031/11 – 2017 අගෝස්තු 08 වැනි අඟහරුවාදා – 2017.08.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළය සුළු කොට්ඨාසයේ, අකුරැස්ස (අ.ග.පි. 179) ගමේ පිහිටි මාතර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ඒකේආර්/2015/594 හා 2016.07.22 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ','සී'හා'ඩී', වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්.0.4047 ක් පමණ වන ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – බෙංවල සහ නයිවල – ප්‍රමාණය: හෙක්. 0.0006 ක් පමණ**

උතුරට: මාර්ගය (මා.සං.අ) සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බෙංවල සහ නයිවල; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බෙංවල සහ නයිවල, ඇළ සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී; බටහිරට: මාර්ගය (මා.සං.අ).

02. **කැබලි අක්ෂර 'සී'– බෙංවල සහ නයිවල – ප්‍රමාණය: හෙක්. 0.0106**

උතුරට: මාර්ගය (මා.සං.අ); නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී, ඇළ සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බෙංවල සහ නයිවල; බටහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බෙංවල සහ නයිවල සහ මාර්ගය (මා.සං.අ).

03. **කැබලි අක්ෂර 'ඩී'– බෙංවල සහ නයිවල – ප්‍රමාණය: හෙක්. 0.3935**

උතුරට: කැබලි අක්ෂර බී, ඇළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බෙංවල සහ නයිවල; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බෙංවල සහ නයිවල; දකුණට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන බෙංවල සහ නයිවල සහ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය; බටහිරට: අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය, ඇළ සහ කැබලි අක්ෂර බී.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2015/එච්ජ්/193.
2017 ජුනි මස 12 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08-756

1A–G26027–14(2017/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*